# චීනයේ නූතන ගමන්මඟ හා නව ප්‍රවණතා

වසන්තා සුහසිංහ

## හැඳින්වීම

1949 ඔක්තෝම්බර් මස 01 දා චීන ජනතාව පා තැබුවේ ඓතිහාසික සන්ධිස්ථානයක් වෙත ය. මාඕසේතුං Mao Zedong (1893-1976) විසින් මහජන චීන සමූහාණ්ඩුව (The people's Republic of China) ප්‍රකාශයට පත්කිරීමත් සමඟ ඔහු කියා සිටියේ චීන ජනතාව සිය දෙපයින් නැගී සිටි බවයි. එදා සිට මේ දක්වා ගත වූ අඩසියවස තුළ ජාත්‍යන්තර බලවේග හමුවේ ස්වකීය පාලන ක්‍රමය වඩාත් තරකරමින් තම ජනතාව වඩාත් සංවර්ධනය වූ මාවතක් කරා රැගෙනයාමට තරම් චීන නායකත්වය ශක්තිමත් වී තිබේ. වර්තමාන චීන සමාජය පිළිබඳ මූලික ආර්ථික, සමාජ, දේශපාලනික හා සංස්කෘතික විවරණයක යෙදීම මෙම ලිපියෙහි අරමුණ වේ.

## සමාජ-ආර්ථික ඉතිහාසය

ඉන්දියාව, රුසියාව, නේපාලය, උතුරු කොරියාව, මියන්මාරය, මොංගෝලියාව, කසකස්ථානය, තජිකිස්ථානය, වියට්නාමය, පකිස්තානය, භූතානය, ඇෆ්ගනිස්ථානය යන රටවල් තම දේශසීමා වශයෙන් පවතින චීනරාජ්‍යය භූමි ප්‍රාමාණික වශයෙන් ගත් කළ ලෝකයේ තුන්වෙනි විශාල රට වශයෙන් හඳුනාගත හැකි ය. වර්ග කිලෝමීටර් 9600000 (Mingjie සහ Grimes 2004) ක් වන භූමි ප්‍රදේශයක් සහිත මෙහි ජන වර්ග 56 ක් ජීවත් වෙති. ඉන් 91% ක් පමණ ප්‍රධාන ජනවර්ගය වන හන් Han ජාතීන් වන අතර ඉතිරි සුළු ජනවර්ග අතර Zhuang, Manuchu, Hui, Miao, Uygur, Yi, Tujia, Mongolia හා Tibet ජාතිකයින් ද වේ. ප්‍රධාන භාෂාව චීන භාෂාව වන අතර එය Mandarin හෙවත් Putong Hua ලෙස හඳුන්වන අතර ප්‍රදේශීය භාෂා විෂමතා හඳුනාගත හැකි ය. ජනගහනය බිලියන 1.3 (Mingile සහ Grimes 2004) ක් ලෙස ලෝකයේ වැඩි ම ජනගහනය සහිත රට ලෙස ද චීනය වඩා අභියෝගාත්මක අවධියකට ලගා වී තිබේ. නමුත් ඒ අතරම ගත වූ පසුගිය වසර කිහිපය තුළ වාර්ෂික ආර්ථික වර්ධන වේගය 8%-9% ක් අතර පවත්වාගෙන යාමට තරම් ශක්තිමත් ආර්ථික ප්‍රතිපත්ති බිහිකරගෙන තිබේ.

චීන ඉතිහාසය පිරික්සීමේ දී වැඩවසම් සමාජ ක්‍රමයක ලක්ෂණත් අධිරාජ්‍ය පාලන ක්‍රමයක් ද හඳුනාගත හැකි ය. කීප අවස්ථාවක දෙස් විදෙස් ආක්‍රමණයන්හි අත්දැකීම් ද ඒ අතර වේ. චීන ප්‍රාකාරය එහි කදිම නිදසුනකි. චීන රාජ වංශය තුළ Qin, Han, jang, Song, Yuan, Ming හා Qing යන අධිරාජ්‍යයන් වැදගත් වේ. චීනය ලෝකය පුරා සේද මාවත (Silk road) හෙවත් කපු නිෂ්පාදනය ඇතුළු අපනයන භාණ්ඩ වර්ධනය කළේ මේ අවදියේදී ය. නූතන චීන ඉතිහාසය ලෙස සලකන්නේ 1840-1919 අතර කාලයයි. 1839-1842 කාලයේදී පමණ අබිං යුද්ධය (Opium war) සමඟ සම්බන්ධවෙමින් බ්‍රිතාන්‍ය, ඇමරිකාව, ප්‍රංශය, රුසියාව හා ජපානය, චීනයට එරෙහිව යුද ප්‍රකාශ කළහ. මෙහිදී චීනය අර්ධ වශයෙන් බ්‍රිතාන්‍යයේ යටත්විජිතයක් බවට පත් වූ අතර ඒ මඟ වෙනස් කිරීමට ගත් උත්සාහයන් අතර 1911 දී පමණ Sunyat-Sen ගත් ප්‍රයත්නය කැපී පෙනේ.